දිවි අහිමි කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවන් ප්‍රවේසම් රහිතව, ආචාර ධාර්මික නොවන අයුරින් ඉදිරිපත් කිරීම ඔස්සේ තවත් දිවි අහිමි කරගැනීම් සිදුවීමට වක්‍රාකාරීව අනුබලයක් ලැබීමේ ඉඩක් තිබේ. මෙවන් ආකාරයෙන් දිවි අහිමි කරගැනීම් පැතිර යා හැකි බව පර්යේෂණ මගින් දැක්වේ. දිවි අහිමි කරගැනීම් පිළිබඳ වාර්තාවන් සමගින් උපකාරක අංක සඳහන් කිරීම සඳහා මාධ්‍ය දිරිමත් කෙරෙන්නේද ඒ හෙයිනි. මන්දයත්, එම උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ දිවි අහිමි කරගැනීමට නැඹුරුවක් ඇති අයෙකුගේ ජීවිතයක් බේරාගැනීමට ඉඩක් ඇති බැවිනි.

අරුණ පුවත්පත (11/12) මගින් "කොරෝනාවෙන් ලෙඩවූ මනසට අංගොඩින් සුවය" යනුවෙන්, කොවිඩ්-19 තත්වය තුළ මිනිසුන් තුළ ඇතිවන ආතතිජනක හැඟීම් සහ කොවිඩ්-19 තත්වය තුළ වන දිවි අහිමි කරගැනීම් සම්බන්ධයෙන් වන ලිපියක් ඉදිරිපත් කොට ඇත. මේ තුළ මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුගත වෙමින්, මාධ්‍ය වගකීම මනාව අවබෝධ කරගනිමින් උපකාරක අංක සඳහන් කොට ඇත. ඒ සම්බන්ධයෙන් අපි අරුණ පුවත්පතට ප්‍රශංසා කර සිටිමු.

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

#COVID19 #MediaEthicsSL #lka #SinhalaPress #Aruna